**ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයේ හා එහි පරිපාලිත සමාගම - 2021**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයේ ("කාර්යාංශය") සහ කාර්යාංශයේ හා එහි පරිපාලිතයේ ("සමූහය") 2021දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හා අලාභ ප්‍රකාශනය සහ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන හා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, කාර්යාංශයේ හා සමූහයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිතියටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කාර්යාංශයේ හා සමූහයේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය කාර්යාංශයේ හා සමූහය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කාර්යාංශයේ හා සමූහයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කාර්යාංශයේ හා සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, කාර්යාංශයේ හා සමූහයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

----------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි  නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින්  විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවාදැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කාර්යාංශයේ හා සමූහයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇතිබව සහ හෙළිදරව්කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ කාර්යාංශයේ හා සමූහයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ කාර්යාංශයේ හා සමූහයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව කාර්යාංශයේ හා සමූහය ක්‍රියාකර ඇති බව,

- කාර්යාංශයේ හා සමූහය සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- කාර්යාංශයේ හා සමූහයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම

----------------------------------------------------

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

------------------------------------------------------

| | විගණන නිරීක්ෂණය<br>-------------------- | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම<br>------------------------ | නිර්දේශය<br>----------- |
|---|---|---|---|
| (අ) | **ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත SLFRS 07 හි 14 ඡේදය – මූල්‍ය සාධන පත්‍රිකා: හෙළිදරව් කිරීම සහ ශ්‍රී.ල. ගි.ප්‍ර LKAS 39 හි 37(අ) ඡේදය- මූල්‍ය සාධන පත්‍රිකා: හඳුනා ගැනීම සහ මැනීම** – කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව, බැංකු ඇපකරවලට ඇපයක් ලෙස ඇප වූ ස්ථාවර තැන්පතුවල වටිනාකම රු.මිලියන 460 ක් වූ අතර කාර්යාංශය විසින් ඉදිරිපත් කරන ලද උපලේඛනයට අනුව එය රු.මිලියන 398.19 ක් විය. මේ අනුව, මෙම සංඛ්‍යා දෙක අතර රු.මිලියන 61.80 ක වෙනසක් නිරීක්ෂණය විය.<br>තවද, ලංකා බැංකුවෙන් ලබාගත් සෘජු තහවුරු කිරීම්වලට අනුව 2021 දෙසැම්බර් 31 දිනට රු.62,712,505 ක මුදලක් ඇපකර ලිපිය ලෙස හිඟව ඇති බව වාර්තා විය. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය සඳහා වන මූල්‍ය | වැරදි සහගත ලෙස රු.මිලියන 398 වෙනුවට රු.මිලියන 460ක් හෙළිදරව් කර තිබුණි. ප්‍රධාන කාර්යාලයේ නිවැරදි උපලේඛනය ඉදිරිපත් කරනු ලැබේ. | කාර්යාංශය වාර්තා කරන දිනයේදී ලබාගත් බැංකු ඇපකරයට එරෙහිව නිවැරදි ඇප මුදල හෙළි කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ප්‍රකාශනවල මෙම මුදල හඳුනාගෙන නොතිබුණි. | | |
| (ආ) | 2021 දෙසැම්බර් 31 දිනට දළ වශයෙන් රු.295,813,575 ක් පිරිවැය වන සම්පූර්ණ ක්ෂය වූ වත්කම් **LKAS - 16 දේපල, පිරියත සහ උපකරණ** හි 51 ඡේදයේ විධිවිධාන අනුව එම වත්කම්වල ප්‍රයෝජනවත් ආර්ථික ආයු කාලය නැවත තක්සේරු කිරීම සහ **LKAS - 08** සහ කාර්යාංශයේ සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්තිය 3.8.6 අනුව මූල්‍ය ප්‍රකාශනවල ඇස්තමේන්තු දෝෂය නිවැරදි කිරීම සහ නිවැරදි ධාරණ අගයන් නොපෙන්වා කාර්යාංශය විසින් පසුගිය වර්ෂ කිහිපය තුළ අඛණ්ඩව භාවිතා කරනු ලැබේ. එබැවින්, එම වත්කම්වල ධරණ අගයන් වාර්තාකරණ කාල සීමාව අවසන් වන විට සාධාරණ වටිනාකමට පිළිබිඹු කර නොතිබුණි. | අපි සම්පූර්ණයෙන්ම ක්ෂය වූ වත්කම් ඇතුළුව සියලු පන්තීන්ගේ වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය සහ අවශේෂ වටිනාකම නැවත තක්සේරු කිරීමේ ක්‍රියාවලියක යෙදී සිටිමු. මෙම වර්ෂය තුළදී මෙම අභ්‍යාසය අවසන් කර ගිණුම්වලට ඇතුළත් කිරීමට අපි අදහස් කරමු. | සම්පූර්ණයෙන් ක්ෂය වූ වත්කම්වල ප්‍රයෝජනවත් ආර්ථික ආයු කාලය නැවත තක්සේරු කිරීමට සහ ඇස්තමේන්තු දෝෂය නිවැරදි කිරීමට සහ ඒ අනුව මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් කිරීමට පියවර ගත යුතුය. |
| (ඇ) | කාර්යාංශය විසින් ගෘහ භාණ්ඩ හා උපාංග, ඉදිකිරීම් උපකරණ සහ උපකරණ, කාර්යාලීය උපකරණ, කම්හල් සහ යන්ත්‍රෝපකරණ, බහාලුම්, පරිගණක යනාදිය සඳහා කාර්යාංශයේ එක් එක් මූලික කාර්යාල විසින් පවත්වනු ලබන වත්කම් සත්‍යාපනයට අනුව එම වත්කම්වල සත්‍ය පැවැත්ම නොසලකා පොදු ලෙජරයේ දක්වා ඇති අගයන් මත ක්ෂයවීම් ගණනය කර තිබුණි. තවද, කාර්යාංශයේ පොදු ලෙජරයේ දැක්වෙන වත්කම්වල පැවැත්ම තහවුරු කිරීම සඳහා කාර්යාංශය මධ්‍යගත වත්කම් ලේඛනයක් පවත්වා ගෙන නොතිබුණි. එබැවින්, මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.635,790,612 ක වටිනාකමට එම වත්කම්වල පිරිවැයේ නිරවද්‍යතාවය සහ සමාලෝචිත වර්ෂය සඳහා රු.545,337,442 ක් ඒ සඳහා සිදු කරන ලද සමුච්චිත ක්ෂයවීම් විගණනයේදී විශ්වාසදායක ලෙස තහවුරු කර ගැනීමට නොහැකි වි | මෙම ස්ථාවර වත්කම්වල භෞතික පැවැත්ම තහවුරු කිරීමේ ක්‍රියාවලිය සිදු වෙමින් පවතින අතර ස්ථාවර වත්කම් ලේඛන පරීක්ෂා කර සත්‍යාපිත විස්තර සමඟ යාවත්කාලීන කිරීමට අපි බලාපොරොත්තු වෙමු. | පොදු ලෙජරයේ දැක්වෙන ස්ථාවර වත්කම්වල භෞතික පැවැත්ම සහතික කිරීම මගින් ක්ෂයවීම් ගණනය කළ යුතුය. තවද, වාර්ෂික සමීක්ෂණ මණ්ඩල පැවැත්වීමට හැකි වන පරිදි යාවත්කාලීන මධ්‍යගත ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන යා යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයට (කාර්යාංශයේ බදුල්ල මූලික කාර්යාලයට අදාළව) දක්වා ඇති රු.625,042,274 ගනුදෙනුකරුවන්ගෙන් අයවිය යුතු මුදලට එකතුව රු.34,168,033 ක් වූ බැර ශේෂ දෙකක් (02) ඇතුළත් කර තිබුණු අතර එම නිසා 2021 දෙසැම්බර් 31 දිනට ගනුදෙනුකරුවන්ගෙන් අයවිය යුතු මුදල එම මුදලින් අඩුවෙන් දක්වා තිබුණි. | ප්‍රමාදදෝෂයකින් ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු ශේෂ ගනුදෙනුකරුවන්ගෙන් අයවිය යුතු ශේෂයන්ට එරෙහිව හිලව් කර ඇත. මෙය 2022 දී නිවැරදි කරනු ඇත. | හර ශේෂයන්ට එරෙහිව හිලව් නොකර ගිණුම්වල බැර ශේෂයන් වෙන වෙනම පෙන්විය යුතුය. |
| (ආ) | ඉදිරිපත් කළ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවලට අනුව, ගිණුම් අයිතම 04 ක් (ලැබිය යුතු වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම්, ගෙවිය යුතු රඳවාගැනීම්, වෙළඳ ණය ගැතියන් සහ වෙළඳ ණයහිමියන්) සම්බන්ධයෙන් ඉවත් කරන ලද මුළු මුදල රු.7,041,261,926 ක් විය. කෙසේ වෙතත්, 2021 වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල කාර්යාංශය විසින් නිවැරදි ශේෂයන් හඳුනාගැනීමේ දුෂ්කරතා හේතුවෙන් මෙම ඉවත් කරන ලද අයිතම රු.47,766,826 කින් අඩුවෙන් දක්වා ඇති බව විගණනයේදී අනාවරණය විය. | **ලැබිය යුතු වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් සහ වෙළඳ ණය ගැතියන්:**<br>පරිපාලිතයට ගෙවන ලද කාර්යාංශයේ වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ශේෂයන් සහ ණය ගැතියන් නිවැරදිය. කෙසේ වෙතත්, වාර්තාගත පරිපාලිතයේ අනුරූප ශේෂය හඳුනාගැනීමේ දුෂ්කරතා හේතුවෙන්, අපට සංඛ්‍යා ඉවත් කිරීමට නොහැකි විය.<br>**වෙළඳ ණයහිමියන්:**<br>කාර්යාංශයේ ණයහිමි ශේෂය පරිපාලිතය සමඟ නිවැරදිය. කෙසේ වෙතත්, පරිපාලිතයේ ණයගැති ශේෂය රු.85,381,104 ලෙස ගිණුම්වල පෙන්වා තිබීම හේතුවෙන් රු.404,624 ක වෙනසක් ඇති විය.<br>ඊට අමතරව කාර්යාංශයේ ඌව මූලික කාර්යාලයේ ණයහිමි ශේෂය රු.146,488,862 වෙනුවට රු.136,219,025 කින් වැරදි ලෙස ඉවත් කර ඇත. තවද, උපදේශන අංශයට අයත් තවත් රු.3,408,103 ක මුදලක් රු.2,448,103 කින් ඉවත් කර ඇත.<br>**ගෙවිය යුතු රඳවාගැනීම්:**<br>අධීක්ෂණයෙන් අපි කාර්යාංශයේ මුදල වෙනුවට පරිපාලිතයේ රඳවාගැනීම් මුදල ඉවත් කර ඇත. | පරිපාලිතය සමඟ අනුරූප ශේෂයන් පරීක්ෂා කිරීමෙන් පසු මූල්‍ය ප්‍රකාශනවල වැරදි සංඛ්‍යා ඉවත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශන සහ එහි පරිපාලිතයේ මූල්‍ය ප්‍රකාශන සමඟ සංසන්දනය කිරීමේදී ගිණුම් අයිතම 03කට අදාළව දැක්වෙන අනුරූප ගෙවිය යුතු සහ ලැබිය යුතු ශේෂයන් අතර රු.199,685,696ක වෙනස්කම් නිරීක්ෂණය විය.<br>තවද, කාර්යාංශය විසින් එහි පරිපාලිතයෙන් ලැබිය යුතු යැයි වාර්තා කරන ලද රු.9,298,487 ක ණයගැති ශේෂයන් පරිපාලිතයේ ණයහිමි ශේෂයට ඇතුළත් කර නොතිබුණු අතර කාර්යාංශයට ගෙවිය යුතු බවට පරිපාලිතය විසින් වාර්තා කරන ලද රු.26,481,152 ක ණයහිමි ශේෂයන් කාර්යාංශයේ ණයගැති උපලේඛනයේ ඇතුළත් කර නොතිබුණි. මෙම අතපසුවීම් සඳහා හේතු විගණනයට පැහැදිලි කර නොතිබුණි. | කාර්යාංශයේ ශේෂයන් නිවැරදි වන අතර සපයනු ලබන සේවාවන් සඳහා ඉන්වොයිසි යවා ඇත. | පරිපාලිතය සමඟ අනුරූප ශේෂයන් පරීක්ෂා කිරීමෙන් පසු මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි සංඛ්‍යා පෙන්විය යුතුය. |
| (ඈ) | කාර්යාංශයේ පොළොන්නරුව මූලික කාර්යාලය ඔවුන්ගේ වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලැබුණු ගිණුමේ රු.811,714ක හර ශේෂයක් පෙන්වා තිබුණි. එබැවින්, සවලීකරන අත්තිකාරම් ලැබීම් ගිණුම එම මුදලින් අඩුවෙන් දක්වා තිබුණි. | මෙම හර ශේෂය සේවාලාභියාගෙන් වැඩිපුර අයකරගත් වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් නිසා සිදුවූ අතර මෙය නිවැරදි කරනු ලැබේ. | බැර ශේෂයන් සහිත ගිණුම්වල හර ශේෂයන් ඇතුළත් නොකළ යුතු අතර, මෙම ශේෂයන් වෙන් වෙන් වශයෙන් පෙන්විය යුතුය. |
| (ඉ) | 2021 දෙසැම්බර් 31 දිනට මුළු ණයගැති ශේෂය රු.මිලියන 5,630.41 ක් වන අතර මෙම වාර්තාව නිකුත් කරන දිනය දක්වා රු.මිලියන 7.75ක් වටිනා ණයගැති තහවුරු කිරීම් 09ක් පමණක් ලැබී තිබීමත්, දිගුකාලීනව හඳුනා නොගත් සහ නොවෙනස්ව පවතින ණයගැති ශේෂයන් පැවතීම සහ කලින් කලට රජයේ අමාත්‍යාංශ (එනම් කාර්යාංශයේ ප්‍රධාන ණය ගැතියන්) වෙනස් වීම තුළින් ඉහත ණයගැති ශේෂයන් තිබේද යන්න තහවුරු කිරීම සඳහා විකල්ප ක්‍රමවේදයන් තුළින් | බාහිර විගණකවරුන් වෙත සෘජුවම තහවුරු කිරීම් ඉල්ලා ශේෂය තහවුරු කිරීමේ ලිපි දැනටමත් සේවාදායකයින් වෙත යවා ඇත. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ණය ගැතියන්ගේ භෞතික පැවැත්ම සහ නිරවද්‍යතාවය තහවුරු කිරීමට ක්‍රියා කළ යුතුය.<br>තවද, ණයගැති ශේෂයන් සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහතික කිරීම සඳහා මූල්‍ය ප්‍රකාශනවල සිදු කළ යුතු අපහායනය සඳහා |

| | | |
|---|---|---|
| සැහීමකට පත් විය නොහැකි වීම යන කරුණු හේතුවෙන් ඉහත ණයගැති ශේෂවලට ඇතුළත්ව ඇති රු.මිලියන 2,280.37 ක් වූ සමස්ත ණයගැති ශේෂවල භෞතික පැවැත්ම සහ එහි නිරවද්‍යතාව සම්බන්ධයෙන් විශාල අවිනිශ්චිතතාවයක් පවතින බව විගණනයට නිරීක්ෂණය විය. | | ප්‍රමාණවත් ප්‍රතිපාදන සිදු කළ යුතුය. |

### 1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | අනුරූපී වාර්තා අනුව වටිනාකම | වෙනස | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | | |
| ගනුදෙනුකරුවන්ගෙන් ලැබිය යුතු | | | | උපලේඛනවල දක්වා ඇති නිවැරදි මුදල් ප්‍රමාණයන් අධීක්ෂණයෙන් මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කළ නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට පෙර උපලේඛන සමඟ ලෙජර ශේෂයන් සංසන්දනය කිරීමට අවධානය යොමු කළ යුතුය. |
| - ඌව මූලික කාර්යාලය | 29,413,645 | 29,412,837 | 808 | | |
| - නැගෙනහිර මූලික කාර්යාලය | 160,463,858 | 159,849,182 | 614,676 | | |
| ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු | | | | | |
| - නැගෙනහිර මූලික කාර්යාලය | 159,843,863 | 159,229,385 | 614,477 | | |
| - මධ්‍යම මූලික කාර්යාලය | 470,994,092 | 470,986,948 | 7,143 | | |
| විවිධ ණයහිමියෝ | 16,610,469 | 16,495,761 | 100,757 | | |
| මුළු වෙනස | | | **1,337,861** | | |

### 1.5.4 අවිනිශ්චිත ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කාර්යාංශයේ මූලික කාර්යාල 15ක් විසින් ඉදිරිපත් කරන ලද සවිස්තරාත්මක උපලේඛන සහ මූල්‍ය ප්‍රකාශන මත සිදු කරන ලද විගණන පරීක්ෂණයේදී එකතුව රු.139,079,791ක ගිණුම් අයිතම 05ක් සම්බන්ධයෙන් හඳුනා නොගත් ශේෂ | මෙම ශේෂයන් දිගු කාලයක් ඉදිරියට ගෙන එන අතර මේ දක්වා ඒවාට හිමිකම් පෑමක් කර නොමැත. එබැවින්, එම ශේෂයන් දැනටමත් ලෙජරයේ අඩමාන/සැක සහිත ලැබිය යුතු | තවදුරටත් ප්‍රමාදයකින් තොරව ගිණුම් පොත්වලින් මෙම අවිනිශ්චිත ස්වභාවයේ ශේෂයන් ඉවත් කිරීමට පියවර ගත යුතුය. |

| | | |
|---|---|---|
| විස්සක් (20) නිරීක්ෂණය විය. ඉහත අයිතම 20 න් රු.17,252,052 ක් වටිනා අයිතම 07 ක් පෙර වර්ෂයේ විගණන වාර්තා මගින් පෙන්වා දෙන ලද හඳුනා නොගත් ශේෂයන් වේ. | සහ ගෙවිය යුතු ලෙස වර්ග කර ඇති අතර කළමනාකාරිත්වයේ අනුමැතිය ඇතිව ඒවා කපා හරිනු ලැබේ/ආපසු එකතු කරනු ලැබේ. | ක්‍රියාමාර්ගයක් ගත යුතුය. |

### 1.5.5 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පරිපාලිත සමාගමේ (සෙන්ට්‍රල් ඉංජිනියරින් සර්විසස් (පුද්ගලික) සමාගම) මූල්‍ය ප්‍රකාශන පිළිබඳ තත්ත්වාගණනය කළ මතය පහත නිරීක්ෂණ මත පදනම්ව මා විසින් ප්‍රකාශ කර ඇත.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01-මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සම්බන්ධ ප්‍රමිතයේ 32 වන ඡේදයට පටහැනිව රු.මිලියන 183.04 ක් සහ රු.මිලියන 38.04ක් වූ ණයගැති බැර ශේෂයන් සහ සවලීකරන අත්තිකාරම් හර ශේෂයන් අවස්ථා 36කදී එම ගිණුම්වල හර සහ බැර ශේෂයන් සමඟ එකිනෙකට කපා හැර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, ජංගම වත්කම් සහ ජංගම වගකීම් සමාන වටිනාකමකින් අඩුවෙන් දක්වා තිබුණි. | සේවාදායකයාගෙන් ලැබුණු මුදල් ණයගැති සාරාංශයේ බැර සටහනක් ලෙස සටහන් කිරීම සහ සේවාදායකයා විසින් සිදු කරන ලද අතිරික්ත ගෙවීම් හේතු කොටගෙන ණයගැතියන්ගේ බැර ශේෂයන් ප්‍රධාන වශයෙන් පැන නැගී තිබුණි. සවලීකරන අත්තිකාරම් සම්බන්ධයෙන් වූ හර ශේෂයන් එම අත්තිකාරම් වැඩිපුර පියවීම සහ දෝෂ සහගත ලෙස වෙනත් ව්‍යාපෘතීන්ගෙන් පියවා ගැනීම හේතු කොටගෙන පැන නැගී තිබුණි. මේවා නිවැරදි කරනු ඇත. | ණයගැතියන් සම්බන්ධයෙන් වූ බැර ශේෂයන් සහ සවලීකරන අත්තිකාරම් සම්බන්ධයෙන් වූ හර ශේෂයන් මත නිවැරදි ගිණුම්කරණ ප්‍රතිපාදනයන් අනුගමනය කරමින් ණයගැති ශේෂයන් සහ වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් නිවැරදි කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | 2021 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 3,553.87 ක් වටිනා ණය ගැතියන්ගෙන් තහවුරු කිරීම් කැඳවනු ලැබුවද, මෙම වාර්තාව නිකුත් කරන දිනය දක්වා විගණනය සඳහා තහවුරු කිරීමක් ලැබී නොමැත. තවද, විගණනය සඳහා ලබා දී ඇති තොරතුරු අනුව, ණය ගැතියන් සඳහා සහතික කළ බිල්පත් දළ වශයෙන් රු.මිලියන 1,200 ක් වාර්තා කරන කාල සීමාව තුළ පමණක් ලබා ගත හැකි බව තහවුරු විය. තවද, සමාගමේ අනුරාධපුර මූලික කාර්යාලයේ ප්‍රධාන මෙහෙයුම් | අපගේ සේවාදායකයින්ගෙන් හිඟ මුදල් එකතු කිරීමට සමාගම කැපී පෙනෙන සැලකිය යුතු උත්සාහයක් දරයි. ප්‍රවර්තන වර්ෂය තුළ සමාගමට ණයගැති අයකර ගැනීමක් ලෙස අපගේ ණය ගැතියන්ගෙන් වැට් බදු කුවිතාන්සි නොමැතිව බිලියන 3.5 කට වඩා ලැබී ඇත. | තවදුරටත් ප්‍රමාදයකින් තොරව හිඟ ශේෂයන් අයකර ගැනීමට ඵලදායී ක්‍රියාමාර්ග ගත යුතු අතර අනාගත වංචා අවම කිරීම සඳහා තවදුරටත් ඵලදායී හා ශක්තිමත් අභ්‍යන්තර පාලන |

| | | | |
|---|---|---|---|
| | ඉංජිනේරුවරයා වාර්තා කර තිබුණේ රු.මිලියන 550 ක ණය ගැතියන්ගේ ශේෂයන් සම්බන්ධයෙන් කිසිදු වාර්තාවක් අනුරාධපුර මූලික කාර්යාලයේ පවත්වාගෙන ගොස් නොමැති බවයි. කෙසේ වෙතත්, එය වාර්තා කරන දිනට සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල ද ඇතුළත් විය. ඉහත කරුණු සලකා බැලීමේදී, 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශනයේ දක්වා ඇති රු.මිලියන 3,553.87 ක ණයගැති ශේෂයේ පැවැත්ම සහ නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමට විගණනයට නොහැකි විය. | මෙම තත්ත්වයත් සමඟ අනුරාධපුර මූලස්ථානයේ දැනට ක්‍රියාත්මක ව්‍යාපෘති 26 ක් තිබුණි. අපි ව්‍යාපෘති 15ක් අවසන් කර භාරදී තිබේ. අනෙකුත් ව්‍යාපෘති 11 ක්‍රියාත්මක වෙමින් පවතින අතර එය නැවත සකස් කරන ලද වැඩ සටහන සමඟ සම්පූර්ණ කරනු ඇත. සමාගම විසින් විමර්ශන සිදු කරනු ලැබේ. | පද්ධතියක් හඳුන්වා දිය යුතුය. |
| (ඇ) | සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 2.3.6 අනුව, සමාගම විසින් වාර්ෂිකව දේපළ, පිරියත සහ උපකරණවල ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය සමාලෝචනය කරන බව සඳහන් විය. කෙසේ වෙතත්, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16- දේපළ, පිරියත සහ උපකරණ 51 වගන්තිය ප්‍රකාරව මුළු වත්කම්වලින් සියයට 30 ක් නියෝජනය කරමින් රු.මිලියන 429.78 ක් පිරිවැය වූ සම්පූර්ණයෙන්ම ක්ෂය වූ වත්කම් එම වත්කම්වල ප්‍රයෝජනවත් ආර්ථික ආයු කාලය නැවත තක්සේරු කිරීමකින් තොරව සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 8 - ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස්වීම් සහ දෝෂ අනුකූලව ඇස්තමේන්තු දෝෂ නිවැරදි කරමින් නිවැරදි ධාරණ අගය මූල්‍ය ප්‍රකාශන තුළ ඉදිරිපත් කිරීමකින් තොරව සමාගම විසින් අඛණ්ඩව භාවිතා කරමින් පවතී. | ගිණුම්කරණ ප්‍රමිත අනුකූලව දේපළ පිරියත හා උපකරණ මූලික සහ පසු හඳුනා ගැනීම සඳහා පිරිවැය පදනම භාවිතා කරනු ලබයි. අප සමාගම විසින් ප්‍රත්‍යාගණන පදනම යොදා නොගන්නා අතර පිරිවැයට ගිණුම්ගත කරයි. කෙසේ වෙතත්, 2021 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 අනුව සම්පූර්ණ ක්ෂය වූ වත්කම් පිළිබඳ තොරතුරු අනාවරණය කර ඇත. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 ප්‍රකාරව සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද වත්කම් සම්බන්ධයෙන් එළදියී ආර්ථික ආයු කාලය ප්‍රත්‍යාගණනය කිරීමට සහ ගිණුම්කරණ ප්‍රමිත 8 ප්‍රකාරව ඇස්තමේන්තු දෝෂ නිවැරදි කිරීමට සමාගම පියවර ගත යුතුය. |
| (ඈ) | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂයන් සහ දේපල, පිරියත සහ උපකරණවල ලියාපදිංචි වටිනාකම (PPE) සහ සම්බන්ධිත සමාගමට ගෙවිය යුතු මුදල සම්බන්ධයෙන් අදාළ අනුරූප උපලේඛනයන් අතර රු.මිලියන 20.65 ක වෙනස්කම් නිරීක්ෂණය විය. | එය අදාළ ස්ථාවර වත්කම් කේතයට නොගැලපෙන ස්ථාවර වත්කම්වල විවිධ කාණ්ඩ වැරදි ලෙස කපා හැරීම නිසා සහ ණය ලදුපත් යාවත්කාලීන වෙනස හේතුවෙන් සමහර වෙනස්කම් පැන නැගී ඇත. | ඒ අනුව මූල්‍ය ප්‍රකාශන නිවැරදි කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඉ) | සමාගමේ තොග ශේෂය යටතේ ආරම්භක නොනිමි වැඩ ලෙස දක්වා ඇති රු.105,091,340 ක් 2021 වර්ෂය තුළදී සම්පූර්ණයෙන්ම නිම කොට බිල්පත් නිකුත් කර අවසන් ලෙස සලකා සමාලෝචිත වර්ෂය තුළ දී සම්පූර්ණෙයන්ම අඩු කර ඇත. | ගනුදෙනුකරුවන් විසින් හිඟ ඉන්වොයිසි නොපියවීම හේතුවෙන් ව්‍යාපෘති දෙකක් (බිඩී - 444 සහ බිඩී - 531) තාවකාලිකව අත්හිටුවා | මූල්‍ය ප්‍රකාශන අදාළ පරිදි නිවැරදි කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කෙසේ වෙතත්, එහි ඇතුළත් රු.24,833,281 ක මුදලක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් සම්පූර්ණයෙන්ම නිම කොට බිල්පත් කොට අවසන් කර නොමැති බව නිරීක්ෂණය වූ අතර ඒ අනුව සටහන 2.6 තුළින් මූල්‍ය ප්‍රකාශන වෙත කරන ලද හෙළිදරව්ව සම්පූර්ණයෙන්ම සාවද්‍ය වේ. | ඇත. මේ සම්බන්ධයෙන් සාකච්ඡා කිහිපයක් පවත්වා ඇති අතර පසුවිපරම් ක්‍රියාමාර්ග ගෙන ඇත. | |
| (ඊ) | සමාගමේ මූලික කාර්යාල දෙකක් (අනුරාධපුර සහ පොළොන්නරුව) සම්බන්ධයෙන් මව් සමාගමට ගෙවිය යුතු රු.මිලියන 21.97 ක මුදල සඳහා සවිස්තරාත්මක උපලේඛන හෝ පිළිගත හැකි ආධාරක ලියකියවිලි විගණනය සඳහා සපයා නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | විවිධ මූලික කාර්යාල අතර සිදු වූ ගනුදෙනු සත්‍යාපනය කිරීම සඳහා පිළිගත හැකි උපකාරක ලේඛන සැපයීම අවශ්‍ය වේ. |
| (උ) | ව්‍යාපෘති ස්ථාන 03ක සහ බත්තරමුල්ල (ඩබ්ලිව්.පී-1) ප්‍රධාන ගබඩාවල භෞතික තොග සත්‍යාපනය සම්බන්ධයෙන් සිදු කරන ලදනියැදි විගණනයේ දී 2021 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 11.77ක තොග හිඟයක් සහ රු.මිලියන 1.5ක තොග අතිරික්තයක් පවතින බව අනාවරණය විය. මේ අතර රු.1,042,413 ක පිරිවැය වූ ස්ථාවර වත්කම් ඩබ්ලිව්.පී-1 මූලික කාර්යාලයේ තොග වටිනාකම තුළ ඇතුළත් විය. කෙසේ වෙතත්, තොග සත්‍යාපන කමිටු විසින් වාර්තා කරන ලද අනෙකුත් ද්‍රව්‍යමය අඩුපාඩු ඇතුළු ඉහත කරුණු නිවැරදි කිරීම සඳහා සමාගම තොගයේ ගැලපීම් සිදු කර නොතිබුණි. තවද, සමාගම සිය තොග අයිතම නිසි ලෙස කේතනය කර නොතිබූ අතර ඒ අනුව වාර්ෂික තොග සත්‍යාපනය හඳුනා ගැනීමට සහ සිදු කිරීමට හැකි වන පරිදි එම කේත ERP පද්ධතියට ඇතුළත් කර නොතිබුණි.<br>ඉහත කරුණු අනුව, 2021 දෙසැම්බර් 31 දිනට පෙන්වා ඇති රු.මිලියන 1,027.02 ක් වූ තොගයේ නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමට නොහැකි විය. | **හිඟය සහ අතිරික්තය තොග -** මේවා ERP පද්ධතිය කාලානුරූපව යාවත්කාලීන නොකිරීම නිසා ඇති විය.<br><br>**ස්ථාවර වත්කම් ස්වභාවයේ අයිතම ඇතුළත් වීම -** සමාගමේ ERP පද්ධතිය ඒවා තොග අයිතම ලෙස වර්ගීකරණය කර ඇති බැවින් එම ද්‍රව්‍ය තොග අයිතම ලෙස ERP පද්ධතියේ ගබඩා කළමනාකරණ මොඩියුලය හරහා මාරු කරන ලදී. | තොග හිඟය සහ අතිරික්තයන් අවම කිරීම සඳහා තොග කළමනාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලනයන් වැඩිදියුණු කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය.<br>තවද, ERP පද්ධතිය තුළ අයිතම නිවැරදිව වර්ගීකරණය කිරීම සඳහා පද්ධති පරාමිතීන් ඇති කළ යුතුය. |
| (ඌ) | සමාගම විසින් රු.1,653,804,990ක සහ රු.2,078,338,828ක එකතු වූ මුදල් පිළිවෙළින් එහි මව් සමාගමෙන් ලැබිය යුතු වෙළඳ ලැබිය යුතු සහ රඳවාගැනීම් ලෙස හඳුනාගෙන තිබුණු අතර 2021 දෙසැම්බර් | මව් සමාගම සමඟ ශේෂයන් හඳුනා ගැනීම සැසඳීම් කිරීම සිදු වෙමින් පවතී. අනාගතයේදී වෙනස්කම් ඇති නොවීමට අවශ්‍ය | අනාගතයේදී වරදවා වටහා ගැනීම් වළක්වා ගැනීම සඳහා වෙනස්කම් |

| | | | |
|---|---|---|---|
| | 31 දිනට මව් සමාගමට ගෙවිය යුතු වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලෙස එකතුව රු.3,345,272,654ක මුදල් හඳුනාගෙන තිබුණි. කෙසේ වෙතත්, මව් සමාගම 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල එම අනුරූප අගයන් පිළිවෙලින් රු.1,643,727,470, රු.2,010,467,225 සහ රු.3,320,415,563 ලෙස පෙන්වා තිබුණි. එබැවින් ඉහත ශේෂ 03 සම්බන්ධයෙන් රු.10,077,520, රු.67,872,603 සහ රු.24,857,091 ක වෙනස්කම් නිරීක්ෂණය විය. එසේ වුවද, ඉහත වෙනස්කම් සඳහා කිසිදු හේතුවක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ක්‍රියාමාර්ග ගෙන ඇත. | සමනය කිරීමට ක්‍රියා කළ යුතුය. |
| (එ) | සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී මූලික කාර්යාලවල උප ඒකක අතර අභ්‍යන්තර ගනුදෙනු ඉවත් කළ යුතුය. කෙසේ වෙතත් රු.116,860,830 සහ රු.2,596,405 ක ශේෂ සමාගමේ ණයහිමි සහ ණයගැති ලේඛනවල පිළිවෙළින් සමාගම විසින්ම ගෙවිය යුතු සහ ලැබිය යුතු ලෙස එසේ ඉවත් කිරීමකින් තොරව ඇතුළත් කර තිබුණි. | වැඩ අධික කාලසීමාවේදී ශේෂයන් වෙන වෙනම හඳුනාගැනීමේ දුෂ්කරතා හේතුවෙන් ගිණුම් සකස් කරන අවස්ථාවේදී අභ්‍යන්තර ණයහිමි සහ ණයගැති ගනුදෙනු ඉවත් කිරීම අපහසු වේ. කෙසේ වෙතත් නිවැරදිකිරීමේ ක්‍රියාමාර්ග මෙම වසරේ සිට ගනු ඇත. | කාලානුරූපීව ඉවත් කළ යුතු අයිතම නිවැරදිව හඳුනාගෙන ඒවා ඉවත් කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඒ) | මූල්‍ය තත්ත්ව ප්‍රකාශයට අනුව, 2021 දෙසැම්බර් 31 දිනට මාර්ගස්ථ මුදල් රු.186,124,863 ක් වන අතර, මෙම මුදල 2021 දෙසැම්බර් 31 දිනට හිඟ ණයගැති ශේෂ පියවීම සඳහා මව් සමාගම (එනම් මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශය) විසින් 2021 දෙසැම්බර් 31 දින නිකුත් කරන ලද චෙක්පත් 06 කින් සමන්විත බව සමාගම විගණනය වෙත දන්වා ඇත. කෙසේ වෙතත් නිකුත් කළ එම චෙක්පත් 06 හි සත්‍ය වටිනාකම රු.197,852,894 කි. එබැවින් රු.11,748,930 ක වෙනසක් මව් සමාගම විසින් නිකුත් කරන ලද චෙක්පත්වල වටිනාකම සහ ගිණුම්වල නිරීක්ෂණය විය. තවද, මෙම චෙක්පත් 2021 ජනවාරි මාසය තුළ තැන්පත් කර ඇත.<br>මේ අතර, වාර්තා කරන දිනට ඉහත මාර්ගගත මුදල් ශේෂය සම්බන්ධයෙන් සවිස්තරාත්මක උපලේඛන සහ මූල්‍ය ප්‍රකාශනවල පෙන්වා ඇති මුදල අතර රු.20,900ක තවත් වෙනසක් නිරීක්ෂණය විය. | තථ්‍ය අගයන් සහ මාර්ගස්ථ මුදල් ගිණුමේ හඳුනාගෙන ඇති මුදල අතර වෙනස සම්පූර්ණයෙන්ම සබරගමුව සහ කටුබැද්ද මූලික කාර්යාල දෙකෙහි චෙක් කුවිතාන්සියේ වැට් සංරචකයේ ප්‍රමාණය විය. | සියලුම මූලික කාර්යාල ගණුදෙනු වාර්තා කිරීමේදී එකම ක්‍රමය අනුගමනය කළ යුතු අතර ඒ අනුව මූල්‍ය ප්‍රකාශන නිවැරදි කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

-------------------------------------

### 1.6.1 ලැබිය යුතු මුදල්

----------------------

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයට අනුව, මුළු ණයගැති ශේෂය රු.මිලියන 5,630.41 ක් වන අතර ඉන් රු.මිලියන 2,734.61 ක් සහ රු.මිලියන 1,871.93 ක් පිළිවෙලින් වර්ෂ 03 ක් සහ වර්ෂ 05 කට වැඩි කාලයක් හිඟව පැවතුනි. මේ අතර, ඉදිකිරීම් කටයුතු සිදු කිරීම සඳහා පරිපාලිතය පිහිටුවීමෙන් පසුව ද වර්ෂ 07කට වැඩි කාලයක් නොගෙවූ රු.මිලියන 1,621.69 ක ඉදිකිරීම් අංශයේ (ඊපීසී) ණයගැති ශේෂය අය කර ගැනීමට කාර්යාංශය අපොහොසත් වී ඇති අතර කාර්යාංශයට 2021 ජනවාරි සිට 2022 මාර්තු දක්වා කාලය තුළ ඉහත මුළු දිගුකාලීන හිඟ ණයගැති ශේෂවලින් අයකර ගැනීමට හැකිව තිබුණේ රු.මිලියන 869.45ක් පමණි. | දුෂ්කර තත්වයන් තුළ පවා 2021 දී දිගුකාලීන හිඟ ණයගැති ශේෂයන් සැලකිය යුතු ප්‍රමාණයක් එකතු කර ගැනීමට අපට හැකි විය. රටේ පවතින දේශපාලන හා ආර්ථික අස්ථාවරත්වය නිසා මෙම කාර්යය වඩාත් දුෂ්කර වී ඇත. කෙසේ වෙතත්, දිගුකාලීන හිඟ ශේෂයන් අයකර ගැනීම සඳහා අඛණ්ඩ උත්සාහයන් ගනිමින් සිටී.<br>තවද, වෙළඳ ණය ගැතියන් සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම පිළිබිඹු කිරීම සඳහා මූල්‍ය ප්‍රකාශනවල ප්‍රමාණවත් ප්‍රතිපාදන සපයා ඇත. | හිඟ ශේෂයන් ප්‍රමාදයකින් තොරව අයකරගත යුතුය. |
| (ආ) | සම්පූර්ණ කරන ලද හෝ අත්හිටවූ ඉදිකිරීම් ව්‍යාපෘති සම්බන්ධයෙන් 2021 දෙසැම්බර් 31 දිනට පිළිවෙළින් වර්ෂ 03 සිට 05 දක්වා සහ වර්ෂ 05කට වැඩි කාලයක් තුළ අයකර නොගත් රු.මිලියන 324.53ක සහ රු.මිලියන 497.64ක රඳවාගැනීම් මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.<br>තවද, කාර්යාංශයේ EPC අංශය විසින් 2021 ජනවාරි 01 දිනට ලැබිය යුතු ලෙස පෙන්වා ඇති රු.මිලියන 2,661.13 ක රඳවා ගැනීම් මුදල්වලින්, රු.මිලියන 1,501.02 ක මුදලක් අයකර ගැනීමකින් තොරව වාර්තා කිරීමේ කාලය අවසන් වන විට නොවෙනස්ව පැවතුනි. | STC අනුමත කිරීම්, ව්‍යාපෘති අවසන් කිරීමේ ප්‍රමාදයන් සහ සේවාලාභීන් විසින් අවසන් හිමිකම් පියවීම නොකිරීම හේතුවෙන් බොහෝ රඳවා ගැනීමේ ශේෂයන් හිඟහිට පවතී. කෙසේ වෙතත්, සිහිකැඳවීම් ලිපි දැනටමත් සේවාදායකයින් වෙත යවා ඇත. එබැවින්, අවසන් කර ඇති මිල ගණන් අනුව රඳවාගැනීම් නිකුත් කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. අප විසින් අවසන් බිල්පත් සකස් කර ඉදිරිපත් කරන විට එම ඉන්වොයිසි පියවීමට සේවාදායකයින්ට මුදල් නොමැති අතර මෙම ගැටලුව කිහිප වතාවක්ම සේවාදායකයින්ට දන්වා ඇත. එබැවින් අපගේ අත්දැකීම් අනුව මෙම රඳවාගැනීම් ද සමථයකට පත් නොවිය හැකිය. කෙසේ වෙතත්, සමහර ඒවා දැනටමත් සම්පූර්ණයෙන්ම සහ අර්ධ වශයෙන් ලැබී ඇත. | බොහෝ කලකට පෙර නිම කරන ලද ව්‍යාපෘතිවලට අදාළව ලැබිය යුතු රඳවාගැනීම් මුදල් තවදුරටත් ප්‍රමාදයකින් තොරව අයකර ගැනීමට නිසි යාන්ත්‍රණයක් හඳුන්වා දිය යුතු අතර දිගුකාලීන ශේෂයන් අයකර ගැනීමේ අවිනිශ්චිතතාව යේ අවදානම අවම කිරීම සඳහා ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2021 වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2021 දෙසැම්බර් 31 දිනට ගනුදෙනුකරුවන්ගෙන් ලැබිය යුතු සහ ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු ශේෂයන් පිළිවෙලින් රු.625,042,274 ක් සහ රු.1,278,670,257 ක් විය. කෙසේ වෙතත්, කාර්යාංශය විසින් සිදු කරන ලද ව්‍යාපෘති අවසන් වූ පසු ගනුදෙනුකරුවන්ගෙන් හෝ ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු මුදලක් නොතිබිය යුතුය. ඊට පටහැනිව, සම්පූර්ණ කරන ලද ව්‍යාපෘති 160කට අදාළව රු.540,460,962ක සහ රු.972,361,851ක ශේෂය පිළිවෙළින් ගනුදෙනුකරුවන්ගෙන් සහ ගනුදෙනුකරුවන්ට ලැබිය යුතු ලෙස පෙන්වා ඇති අතර මෙම ගිණුම් ශේෂයන් නිරවුල් කිරීමට නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. ප්‍රධාන වශයෙන් කාර්යාංශය තුළ නිසි හා කාලෝචිත බිල්පත් ක්‍රමවේදයක් නොතිබීම හේතුවෙන් මෙම ගැටලුව මතුව ඇති බව වැඩිදුරටත් නිරීක්ෂණය විය. | නිවැරදි කළ හැකි ප්‍රමාණයන් සමාලෝචනය කිරීමෙන් පසු මෙම සංඛ්‍යා 2022 දී නිවැරදි කරනු ලැබේ. | සම්පූර්ණ කරන ලද ව්‍යාපෘති සම්බන්ධයෙන් දිගුකාලීන හිඟ ශේෂයන් නිරවුල් කර ගැනීමට සහ වයස් විශ්ලේෂණයක් සකස් කර ගිණුම්වල නිසි ගැලපීම් සිදු කිරීමට තවදුරටත් ප්‍රමාදයකින් තොරව ඵලදායී සහ නිසි වැඩ සැලැස්මක් හඳුන්වා දිය යුතුය. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල 5.4.4 (iii) මාර්ගෝපදේශයට අනුව, සියයට 90 ක සම්පූර්ණ මට්ටමට ළඟා වූ ව්‍යාපෘති කටයුතුවලට පෙර ලැබුණු වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් සම්පූර්ණයෙන්ම පියවිය යුතුය. එසේ වුවද, සම්පූර්ණයෙන් නිම කරන ලද ඉදිකිරීම් ව්‍යාපෘති 19ක් සම්බන්ධයෙන් රු.මිලියන 76.6ක අත්තිකාරම් මුදලක් 2021 දෙසැම්බර් 31 දිනට පියවීමකින් තොරව ගිණුම්වල රැඳී පැවතුනි. මේ අතර, ආරම්භ නොකළ ව්‍යාපෘති 06ක් සහ අතහැර දැමූ ව්‍යාපෘති 09ක් | - රු.මිලියන 174.82 ක් සහ රු.මිලියන 104.07 ක් වූ වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් පිළිවෙළින් ක්‍රියාත්මක ව්‍යාපෘති 10ක් සහ ආරම්භ නොකළ ව්‍යාපෘති 06කට අදාළ වේ.<br>- රු.මිලියන 155.59 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් අත්හැර දමා ඇති ව්‍යාපෘති 09 කට අදාළ වේ.<br>- රු.මිලියන 76.6 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් සම්පූර්ණ කරන ලද ව්‍යාපෘති 19ක් සඳහා අදාළ වේ. නමුත් මෙම මුදල | කළ හැකි සියලුම දිගුකාලීන හිඟ වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ප්‍රමාදයකින් තොරව පියවීමට සහ අනෙක් දැ ආදායම ලෙස සැලකීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සම්බන්ධයෙන් පිළිවෙළින් ලැබුණු රු.මිලියන 104.07ක් සහ රු.මිලියන 155.59ක් වූ වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදල් පියවීමට නිසි ක්‍රියාමාර්ගයක් නොගෙන කාර්යාංශයේ රඳවා තබා ගෙන තිබුණි.<br>2021 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු සම්පූර්ණ වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් රු.මිලියන 3,786.14 ක් වූ අතර පසුගිය වර්ෂ කිහිපය තුළ විවිධ ඉදිකිරීම් කටයුතු සිදු කිරීම සඳහා මෙම මුදල් රජයෙන් සහ අර්ධ රාජ්‍ය ආයතනවලින් ලැබුණු බව වැඩිදුරටත් නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, ඉන්, එසේ ලැබුණු රු.මිලියන 1,194.01 ක මුදලක් 2022 මැයි 31 දිනට වන විටත් අදාළ රාජ්‍ය ආයතන වෙත පියවීමකින් තොරව වර්ෂ 03කට වැඩි කාලයක් කාර්යාංශය විසින් අඛණ්ඩව පරිහරණය කරනු ලැබේ. | ගනුදෙනුකරුවන් විසින් අය කර ගෙන නොමැත.<br>පොදුවේ ගත් කල, ව්‍යාපෘති වර්ෂ 3කට වැඩි කාලයක් අඛණ්ඩව පවතී. තවද ව්‍යාපෘතිවල ප්‍රගතියට අනුකූලව සහ ගනුදෙනුකරුවන් විසින් නිකුත් කරන ලද ගෙවීම් සහතික අනුව වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් අයකර ගැනීම් සිදු කෙරේ. එබැවින් ඉහත විගණන නිරීක්ෂණය පිළිගත නොහැකිය. | |
| (ආ) | 2021 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ණයහිමියන් සහ රඳවාගැනීම් පිළිවෙලින් රු.මිලියන 2,309.34 ක් සහ රු.මිලියන 2,206.28 ක් විය. විගණනය සඳහා සපයා ඇති වයස් විශ්ලේෂණවලට අනුව, ණයහිමියන් රු.මිලියන 603.14 ක් සහ ජංගම වගකීම් යටතේ පෙන්වා ඇති රු.මිලියන 305.12 ක රඳවා ගැනීමේ මුදල් වර්ෂ 05කට වැඩි කාලයක් පියවීම හෝ නිෂ්කාශනය කිරීමකින් තොරව ගිණුම්වල රැඳී පැවතුනි. | ණයහිමියන්ගෙන් සියයට 90කට වඩා වැඩි ප්‍රමාණයක් සහ රඳවාගැනීම් පරිපාලිතය (CESL) සඳහා ගෙවිය යුතු මුදල්වලින් සමන්විත වේ. එම ව්‍යාපෘතිවල බාහිර ගනුදෙනුකරුවන් සඳහා අනුරූප ණයගැති සහ ලැබිය යුතු රඳවාගැනීමේ මුදල් ද ගිණුම්ගත කර ඇති අතර මෙම සියලු ව්‍යාපෘති දිගු කාලයක් අඛණ්ඩව පවත්වාගෙන යනු ලැබේ.<br>එබැවින්, ඉහත සඳහන් ණයහිමියන් සහ රඳවාගැනීම් පියවනු ලබන්නේ ණය ගැතියන් සහ රඳවාගැනීම් බාහිර ගනුදෙනුකරුවන්ගෙන් ආපසු අයකර ගත් පසු පමණි. | ණයහිමියන් සහ ගෙවිය යුතු රඳවාගැනීම් නියමිත කාලසීමාව තුළ පියවිය යුතු අතර නිදහස් කළ හැකි මුදල් නිදහස් කිරීමටත් අනෙක් ඒවා ආදායම ලෙස සැලකීමටත් කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව කාර්යාංශය විසින් ගෙවිය යුතු ආදායම් බද්ද රු.689,135,858කි. ඉන් රු.316,937,620ක් සහ රු.510,213,118ක් පිළිවෙළින් වර්ෂ 05 ඉක්මවා සහ වර්ෂ 03 ඉක්මවා නොපියවා පැවතිණි. මෙම ශේෂය | පසුගිය වර්ෂ කිහිපය තුළ දීර්ඝ කාලයක් තිස්සේ පවතින වෙළෙඳ ලැබිය යුතු මුදල් සහ රට තුළ පවතින අහිතකර තත්ත්වය හේතුවෙන් කාර්යාංශයේ ද්‍රවශීලතා තත්ත්වයට අහිතකර ලෙස බලපා ඇත. | කාර්යාංශය දේශීය ආදායම් පනතේ සහ විධිවිධානවලට<br>අනුකූල විය යුතු අතර ප්‍රමාද වූ ගෙවීම් සඳහා වන අධිභාර වළක්වා ගැනීම |

| | | |
|---|---|---|
| දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කිරීමට හෝ දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා සමඟ සාකච්ඡා කර සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි. | කාර්යාංශයේ අඛණ්ඩ ද්‍රවශීලතා ගැටළු ඉහත බදු වගකීම් පියවීම ප්‍රමාද වීමට හේතු විය. මූල්‍යමය බාධා මධ්‍යයේ වුවද, කාර්යාංශය විසින් 2021 වර්ෂය තුළ මුළු ආදායම් බදු වගකීමෙන් රු.මිලියන 66 ක් පියවා ඇත. | සඳහා දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත ගෙවිය යුතු ආදායම් බද්ද ප්‍රේෂණය කිරීමට වහා පියවර ගත යුතුය. |

### 1.6.3 අත්තිකාරම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2015 ජූලි 14 දිනැති රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ අංක 3/2015 මගින් සංශෝධිත ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රජයේ 371 මුදල් රෙගුලාසිය සහ කාර්යාංශයේ මූල්‍ය අධිකාරිය පැවරීම ප්‍රකාරව විවිධ අරමුණු සඳහා ලබා දී ඇති අත්තිකාරම් රු.1,699,093 ක් සහ රු.1,024,217 ක් වාර්තා කරන දිනට පිළිවෙලින් වර්ෂ 03 ඉක්මවා සහ වර්ෂ 05 ඉක්මවා පියවා නොතිබුණි. | රු.2,356,768 හඳුනා නොගත් දිගුකාලීන හිඟ මුදල් වේ. ඒවා සැක සහිත ශේෂයන් ලෙස වර්ග කිරීමට කටයුතු කර ඇති අතර ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සඳහා කළමනාකාරීත්වය වෙත යොමු කරනු ඇත. එසේම ඉතිරි හිඟ ශේෂ පියවීමට කටයුතු කර ඇත. | අත්තිකාරම් ලබා දී ඇති අරමුණු අවසන් වූ වහාම එය පියවා ගැනීමට අවධානය යොමු කළ යුතුය. |

### 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාවසාය චක්‍රලේඛ අංක පීඊඩී/12 යහපාලනය සඳහා වන රාජ්‍ය ව්‍යාවසාය මාර්ගෝපදේශ සහ රජය සතු ව්‍යාවසායන් සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශ. | | | |
| (i) | 9.3.1 ඡේදය | කාර්යාංශයේ අනුමත බඳවා ගැනීම් සහ උසස්වීම් යෝජනා ක්‍රමයක් තිබිය යුතු වුවද, එම යෝජනා ක්‍රමය 2022 ජූලි 30 දිනට පවා | MM මට්ටමට HM මට්ටමට බඳවා ගැනීමේ සහ උසස් කිරීමේ යෝජිත යෝජනා ක්‍රමයක් | අනුමත සේවක සංඛ්‍යාවේ සියලුම මට්ටම් සඳහා අනුමත බඳවාගැනීම් සහ උසස්වීම් යෝජනා |

| | | | | |
|---|---|---|---|---|
| | | මධ්‍යම හා ඉහළ මට්ටමේ කළමනාකාරීත්වයේ තනතුරු සඳහා සකස් කර අනුමත කර නොතිබුණි. මේ අතර, 2005 - 2019 කාලය තුළ වරින් වර කොන්ත්‍රාත් පදනම මත බඳවා ගත් නිලධාරීන් 252 දෙනෙකුගේ කොන්ත්‍රාත් කාලය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ එකඟතාවය ලබාගෙන ස්ථිර පදනමින් ඔවුන් බඳවා නොගෙන සමාලෝචිත වර්ෂය දක්වා අවස්ථා 2227 කදී අඛණ්ඩව දීර්ඝ කර තිබුණි. | 2022 මාර්තු අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සමඟ ඉදිරියට යාමට ඔවුන්ගේ අනුමැතිය බලාපොරොත්තුවෙන් සිටී. | ක්‍රමයක් කාර්යාංශය ලබා ගත යුතුය. දීර්ඝ කාලයක් කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් නිලධාරීන් සම්බන්ධයෙන් නිසි පියවර ගත යුතුය. |
| (ii) | 9.14 ඡේදය | මානව සම්පත් කළමනාකරණයට අදාළ සියලු කරුණු සම්බන්ධයෙන් නීති රීති සපයන ක්‍රියා පටිපාටි අත්පොතක් තිබිය යුතු වුවද, කාර්යාංශයේ මානව සම්පත් සුමට හා ඵලදායී පරිපාලනය සඳහා කාර්යාංශය සතුව එවැනි අනුමත අත්පොතක් නොතිබුණි. | කාර්යාංශයේ මානව සම්පත් සහ පරිපාලක ඒකකය විසින් 2021 වර්ෂයේ දී මානව සම්පත් කළමනාකරණය සහ පරිපාලනය සම්බන්ධ සියලු කරුණු සම්බන්ධයෙන් නීති රීති සැපයීම සමඟ ක්‍රියා පටිපාටි අත්පොත සම්පූර්ණ කරන ලද අතර දැනට එය කාර්යාංශයේ ERP පද්ධතියටද උඩුගත කර ඇත. | මානව සම්පත් ක්ෂේත්‍ර සඳහා නිසි ලෙස අනුමත කරන ලද අත්පොත් කාර්යාංශයෙන් ලබා ගත යුතුය. |
| (ආ) | වත්කම් කළමනාකරණ චක්‍රලේඛ 2017 ජූනි 28 දිනැති අංක 01/2017 සහ 2020 ජනවාරි 03 දිනැති අංක 01/2017(1) | ඉදිකළ වර්ෂය, ගොඩනැගිලිවල වටිනාකම, එක් එක් කාණ්ඩවලට අයත් සේවක සංඛ්‍යාව, විදුලි පිරිවැය, භාවිතා කළ ගොඩනැගිලි පිළිබඳ විස්තර සහ ලබා දුන් හෝ උපකුලී ගොඩනැගිලි පිළිබඳ තොරතුරු යනාදිය 2022 ජූනි 30 දින වන විටත් ඉල්ලා සිටි පරිදි පාලක ජනරාල් වෙත ඉදිරිපත් කර නොතිබුණි. | අපි දැනටමත් එම තොරතුරු 2022.03.04 දින පාලක ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර ඇත. | පෙන්වා දී ඇති තොරතුරු චක්‍රලේඛය අනුව ඉදිරිපත් කළ යුතුය. |

### 1.8 මුදල් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වර්ෂ 1 සිට 2 දක්වා කාලසීමාව සඳහා බැංකු ජංගම ගිණුම් 06ක රු.1,355,214ක් වූ බැංකු ශේෂ 06ක් අක්‍රීය කිරීමට අවසර දී තිබුණද, බැංකු ගිණුම් අඛණ්ඩව අවශ්‍ය බව සාධාරණීකරණය කිරීම සඳහා අර්ධ වාර්ෂිකව සමාලෝචනය කිරීමෙන් 2022 අප්‍රේල් 30 වන දින දක්වාත් මෙම අක්‍රීය බැංකු ගිණුම් වසා දැමීමට කළමනාකාරීත්වයේ අවධානය යොමු වී නොතිබුණි. | මෙම ගිණුම් වසා දැමීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර එවා කලින් වසා දැමීමට නියමිතය. | කාර්යාංශය මගින් ක්‍රියාත්මක වන අක්‍රීය බැංකු ගිණුම් සහ පෞද්ගලික බැංකු ගිණුම් වසා දැමීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.236,964,960ක ශුද්ධ ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ශුද්ධ ලාභය රු.261,360,170 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.24,395,210ක පිරිහීමක් නිරීක්ෂණය විය. පසුගිය වර්ෂයට සාපේක්ෂව ඉදිකිරීම් ආදායම සහ මූල්‍ය ආදායම අඩුවීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්, ඉකුත් වර්ෂය සමඟ සසඳන විට වැඩිවීමේ හෝ අඩුවීමේ ප්‍රතිශත විශ්ලේෂණය පහත දැක්වේ.

| විස්තරය | 2021 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය | 2020 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය | වෙනස වාසිදායක/ (අවාසිදායක) | ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | % |
| **මෙහෙයුම් ආදායම** | | | | |
| ඉදිකිරීම් | 3,947.26 | 4,124.05 | (176.79) | 4 |
| උපදේශන | 2,116.50 | 2,007.79 | 108.71 | 5 |
| **වෙනත් ආදායම්** | | | | |
| කුලී ආදායම් | 20.16 | 32.52 | (12.36) | 38 |
| විවිධ ආදායම් | 36.59 | 21.96 | 14.63 | 67 |
| මූල්‍ය ආදායම් | 175.84 | 263.17 | (87.33) | 33 |
| **වියදම්** | | | | |
| ක්ෂයවීම් | 154.71 | 173.62 | 18.91 | 11 |
| පරිපාලන වියදම් | 681.48 | 656.53 | (24.95) | 4 |
| විකුණුම් සහ බෙදාහැරීමේ වියදම් | 29.21 | 0.47 | (28.74) | 6115 |
| මූල්‍ය පිරිවැය | 5.03 | 4.94 | (0.09) | 2 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණද කරනු ලැබේ.

(අ) කාර්යාංශයේ මූල්‍ය සම්පත් සහ ස්ථාවර වත්කම් පිළිවෙළින් රු.මිලියන 3,223.35ක් සහ රු.මිලියන 4,480.85ක් කාර්යක්ෂම ලෙස භාවිතා කරමින් ආදායම ඉහළ නැංවීමට කළමනාකාරීත්වයේ අවධානය යොමුවිය යුතුය.

(ආ) ඉදිකිරීම් කටයුතු සඳහා එහි පරිපාලිතය ස්ථාපිත කිරීමෙන් පසුව පවා ඉදිකිරීම් අංශය (EPC) අඛණ්ඩව අලාභ ලබමින් (2020 සහ 2021 වර්ෂ සඳහා මෙහෙයුම් අලාභය රු.මිලියන 53.89 ක් සහ රු.මිලියන 39.57 ක්) පවත්වාගෙන යාමේ අවශ්‍යතාවය පිළිබඳව කළමනාකාරීත්වය ඉහළ අවධානයක් යොමු කළ යුතුය.

**2.3 අනුපාත විශ්ලේෂණය**

ලබා දී ඇති තොරතුරුවලට අනුව, සමාලෝචිත වර්ෂය සහ පෙර වර්ෂය සඳහා කාර්යාංශයේ වැදගත් ගිණුම්කරණ අනුපාත කිහිපයක් පහත දැක්වේ.

| අනුපාත | 2021 | 2020 | 2019 |
|---|---|---|---|
| **ලාභදායිතා අනුපාත** | | | |
| දළ ලාභ අනුපාතය (GP) (%) | 10.88 | 8.12 | 7.64 |
| මෙහෙයුම් ලාභ අනුපාතය (%) | 1.09 | 0.05 | 0.39 |
| වත්කම් මත ඉපයීම (ROA) (%) | 1.26 | 1.34 | 1.73 |
| **ද්‍රවශීලතා අනුපාත** | | | |
| ජංගම වත්කම් වත්කම් අනුපාතය (වාර ගණන) | 1: 1.3 | 1:1.2 | 1:1.2 |
| ක්ෂණික වත්කම් වත්කම් අනුපාතය (වාර ගණන) | 1:1.3 | 1:1.2 | 1:1.2 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණය කරනු ලැබේ.

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයද කරනු ලැබේ.

කාර්යාංශය එහි මුළු වත්කම් පදනම වන රු. 18,764,612,183 භාවිතා කරමින් සමාලෝචිත වර්ෂය තුළ රු.236,964,960 ක බදු පෙර ශුද්ධ ලාභයක් උපයා තිබුණි. එබැවින්, මුළු වත්කම්වල ප්‍රතිලාභය සියයට 1.26 ක් (2020 - සියයට 1.34) පමණක් වූ අතර 2012 වර්ෂයේ සිට මෙය වර්ෂයෙන් වර්ෂය ක්‍රමයෙන් අඩු වී ඇත. තවද, මෙය සමාන කර්මාන්තයේ සාමාන්‍යයෙන් පිළිගත් අනුපාතය හා සසඳන විට ඉතා අඩු විය.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2007 සිට 2021 දක්වා කාලය තුළ කාර්යාංශය සමඟ ඇති කර ගත් බැඳුම්කර ගිවිසුම් කඩ කළ සහ වැටුප් රහිත නිවාඩු මත විදේශගත වූ නිලධාරීන් | ඉදිරි ක්‍රියාමාර්ග සඳහා ඉල්ලා සිටින වාර්තා සහ ලිපිගොනු නීති අංශය වෙත යවා ඇත. | එම නිලධාරීන්ට ගෙවා ඇති හිඟ පාඨමාලා ගාස්තු අයකර ගැනීම සඳහා කාර්යාංශය |

| | | | |
|---|---|---|---|
| | 10 දෙනෙකුගෙන් අයකරගත හැකි රු.8,660,406 පාඨමාලා ගාස්තු අයකර ගැනීමට කාර්යාංශය ඵලදායි ක්‍රියාමාර්ග ගැනීමට අපොහොසත් වී තිබුණි. | | සමඟ ඇති කර ගත් බැඳුම්කර ගිවිසුම් කඩ කළ නිලධාරීන්ට එරෙහිව කාර්යාංශය නීතිමය පියවර ගත යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කාර්යාංශයේ ඉංජිනේරු ප්‍රසම්පාදන ඉදිකිරීම් (EPC) අංශයට අයත් මූලික කාර්යාල අටක් (08) 2021 වර්ෂයේදී රු.72,435,372 ක සමස්ත මෙහෙයුම් අලාභයක් ලබා ඇති අතර එම මූලික කාර්යාලවලින්, මූලික කාර්යාල 05ක් 2018 වර්ෂයේ සිට මෙහෙයුම් අලාභ වාර්තා කර තිබූ අතර 2017 වර්ෂයේ සිට මූලික කාර්යාල 03ක් මෙහෙයුම් පාඩු වාර්තා කර තිබුණි. ඊට අමතරව කාර්යාංශයේ උපදේශන අංශ 06ක් 2021 වර්ෂයේදී රු.93,140,717ක සමස්ත මෙහෙයුම් අලාභයක් වාර්තා කර තිබූ අතර ඉන් අංශ 03 ක් 2017 වර්ෂයේ සිට අඛණ්ඩව මෙහෙයුම් පාඩු වාර්තා කර තිබුණි. | අපගේ පාලනයෙන් බැහැරව ඇති රටේ ආර්ථික පසුබෑම කාර්යාංශයේ ක්‍රියාකාරීත්වයට අහිතකර ලෙස බලපා ඇත.<br>කාර්යාංශයේ උපදේශන අංශයේ වියදම් මධ්‍යස්ථාන 20ක් ඇත. ඔවුන්ට විවිධ කාර්යයන් ඇති අතර විවිධ කාර්ය මණ්ඩල ප්‍රමාණයන් ඇත, නමුත් කාර්යාංශයේ මුළු උපදේශන ආදායම් ප්‍රතිදානය නිෂ්පාදනය කිරීමට ඔවුන් සියල්ලෝම එකමුතුව ක්‍රියා කරති. එබැවින් ඒවා තනි ඒකක ලෙස සලකා ඇතැම් ඒකකවල ක්‍රියාකාරීත්වය අඩු බව ප්‍රකාශ කිරීම පිළිගත නොහැක.<br>කෙසේ වෙතත්, කාර්යාංශයේ මානව හා භෞතික වත්කම් උපරිම ප්‍රයෝජනයට ගැනීම සඳහා කාර්යාංශයේ විෂය පථය තුළ නව ව්‍යාපාරික මාර්ග සෙවීමට කළමනාකාරීත්වය දැනටමත් පියවර ගෙන ඇත. තවද, EPC මූලික කාර්යාලයන්හි මෙහෙයුම් අලාභය සඳහා ප්‍රධාන හේතුව වූයේ ප්‍රධාන වශයෙන් නැවත තක්සේරු කළ මෝටර් වාහන සහ යන්ත්‍ර සූත්‍රවලින් පරිපාලන පිරිවැයට ඇතුළත් වූ අධික ක්ෂයවීම් හේතුවෙනි. | මූල්‍ය ආදායම වැඩි කරනවාට වඩා කාර්යාංශයේ මෙහෙයුම් ආදායම ඉහළ නැංවීම කෙරෙහි කාර්යාංශයේ කළමනාකාරීත්වය අවධානය යොමු කළ යුතුය. |
| (ආ) | විගණනය සඳහා සපයා ඇති ඉදිකිරීම් ආදායම් හඳුනාගැනීමේ ප්‍රකාශයන්ට අනුව, 2021 වර්ෂය අවසන් වන විට රු.146,791,423 ක මුළු අලාභයක් සහිතව ඉදිකිරීම් ව්‍යාපෘති 19 ක් අවසන් කර තිබුණි. | පාඩු ලැබීමට හේතු පහත පරිදි වේ.<br>- ආර්. ප්‍රේමදාස ක්‍රිකට් ක්‍රීඩාංගනය ආශ්‍රිතව වෙන්වූ වැඩ තුනක් තිබූ අතර කාර්යාංශයේ අභ්‍යන්තර අංශයකට ගෙවන ලද උපදේශන ගාස්තු මෙම වැඩ ක්ෂේත්‍රය යටතේ සටහන් කර ඇත. කෙසේ වෙතත් එම අභ්‍යන්තර ගෙවීම වැඩ ක්ෂේත්‍ර 3ටම අදාළ වේ. ඒ නිසා සමස්තයක් | ඉදිරියේදී මෙම ව්‍යාපෘති පාඩු අවම කර ගැනීමට කාර්යාංශය විසින් ඵලදායී ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | වශයෙන් මේ ව්‍යාපෘතියෙන් පාඩුවක් සිදු වී නැත.<br><br>- සමහර අමතර වැඩ නිසා ව්‍යාපෘති කිහිපයකට පාඩු සිදු විය.<br><br>- සේවාලාභියා තවම අනුමත කර නොමැති බැවින් කොන්ත්‍රාත්තු මුදල සඳහා වෙනස්කම් සහ මිල වැඩිකිරීම් සලකා බලනු නොලැබේ.<br><br>- සේවාදායකයා නාම මාත්‍ර (Pro-forma) ඉන්වොයිසියට වඩා අඩු අගයක් සහතික කළේය. ඒ නිසා ව්‍යාපෘති පාඩු ලබන තත්ත්වයට පත් විය.<br><br>- අවසාන ගෙවීම් සහතික ලැබී නොමැති අතර අනපේක්ෂිත පිරිවැයක් දැරීමට සිදු විය. මෙම වියදම නිසා ව්‍යාපෘති පාඩුවකට යොමු විය.<br><br>- වෙනත් ව්‍යාපෘතිවල යම් පිරිවැයක් අධීක්ෂණයෙන් ව්‍යාපෘති සඳහා දරා ඇත. මෙය නිවැරදි කරනු ඇත.<br><br>- සමහර ව්‍යාපෘති සඳහා තවමත් එස්.ටී.සී. අනුමැතිය ලැබී නොමැති අතර සිදු කරන ලද වැඩවලින් සියයට 90 ක් මේ දක්වා සහතික කර ඇත. එබැවින් එස්.ටී.සී. අනුමැතිය ලබා ගැනීමෙන් පසු මෙම පාඩුව අඩු වනු ඇත. | |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසානයේදී කාර්යාංශය ප්‍රති මිලදී ගැනීමේ ගිවිසුම් (Repo), අරමුදල් ගිණුම් සහ ස්ථාවර තැන්පතු ආදියෙහි ආයෝජනය කර ඇති රු.3,223,350,872 ක කෙටිකාලීන හා දිගුකාලීන ආයෝජන මත රු.170,809,765 ක ශුද්ධ පොලී ආදායමක් උපයා තිබුණි. මෙම ශුද්ධ පොලී ආදායම සමාලෝචිත වර්ෂය | කොවිඩ්-19 වසංගතයේ බලපෑමත් සමඟ රටේ මෙහෙයුම්වලට ඇති වූ අහිතකර ආර්ථික බලපෑම හේතුවෙන් 2019 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා මෙහෙයුම් ලාභය විශාල ලෙස අඩු වී ඇත.<br>තවද, ඉදිකිරීම් කර්මාන්තයේ පසුබෑම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ ප්‍රමාණවත් මෙහෙයුම් ලාභයක් ලබා ගැනීමට කාර්යාංශයට නොහැකි විය.<br>එසේම, උපදේශන සහ ඉදිකිරීම් ස්වභාවික ව්‍යාපෘතිවල නියැලී සිටින සංවිධානයක් ලෙස, අපට වැඩ ආරම්භ | මෙහෙයුම් ආදායම ඉහළ නංවා ගැනීමටත්, අතිරික්ත මුදල් යොදා ගනිමින් කාර්යාංශයේ ප්‍රධාන අරමුණු හා පරමාර්ථ ඉටු කිරීමටත් කළමනාකාරීත්වය අවධානය යොමු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සඳහා රු.236,964,960 බදු පෙර ලාභයෙන් සියයට 72.08ක් නියෝජනය කෙරේ. මේ අතර, මෙම අතිරික්ත මුදල් කාර්යාංශයේ ප්‍රධාන අරමුණු සහ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා යෙදවීමට කාර්යාංශයේ අවධානය යොමු වී නොතිබුණි. | කිරීමේ අත්තිකාරම් ලැබෙන අතර ඒවා අපේක්ෂිත අරමුණු සඳහා භාවිතා කරන තෙක් කෙටි කාලීන තැන්පතු වල ඵලදායී ලෙස භාවිතා කරනු ලැබේ. බොහෝ ව්‍යාපෘති ලැබුණු විට, වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් සහ කාර්ය සාධන සහතිකවලට එරෙහිව ස්ථාවර තැන්පතු (FDs) සුරක්ෂිත කිරීම අවශ්‍ය වේ. | |
| (ඇ) | කාර්යාංශය එහි ස්ථාවර වත්කම් නිසි ලෙස කේතනය කර නොතිබුණු අතර මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති රු.මිලියන 4,191.66 ක් වටිනා දේපළ, පිරියත සහ උපකරණවල (PPE) භෞතික පැවැත්ම හඳුනා ගැනීමටත් ඒ අනුව වාර්ෂික වත්කම් සත්‍යාපනය කිරීමටත් හැකි වන පරිදි එම කේතයන් ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කර නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛනය ඒ අනුව යාවත්කාලීන කරනු ඇත. | කාර්යාංශය එහි ස්ථාවර වත්කම් නිසි ලෙස කේතනය කළ යුතු අතර එම කේතයන් ස්ථාවර වත්කම් ලේඛනවල ඇතුළත් කළ යුතුය. |

## 3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

<table>
<tr><th></th><th>විගණන නිරීක්ෂණය</th><th>කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම</th><th>නිර්දේශය</th></tr>
<tr><td>(අ)</td><td>සියලුම ඉදිකිරීම් ව්‍යාපෘති උප කොන්ත්‍රාත්තුව එහි පරිපාලිතයට පැවරීම හේතුවෙන්, කාර්යාංශය දැනට නියැලී සිටින්නේ උපදේශන කටයුතුවල පමණි. එබැවින් උපදේශන ආදායම පමණක් උපයා ගැනීම සඳහා ඉංජිනේරුවන් 395 ක් ඇතුළුව සේවකයින් 1,094 ක් පමණ සේවයේ යොදවා තිබීම විගණනයට ගැටළු සහගත විය. තවද, 2012 වර්ෂයේදී එනම් පරිපාලිතය පිහිටුවීමට පෙර කාර්යාංශය එක් ඉංජිනේරුවෙකු සහ එක් සේවකයෙකු සඳහා පිළිවෙලින් රු.මිලියන</td><td>උපදේශන ව්‍යාපෘතිවලට අනුයුක්ත ඉංජිනේරුවෙකුට ලැබෙන ආදායමේ එවැනි තත්වයන් කිසිවක් නැත.
<table>
<tr><th></th><th>2012</th><th>2021</th></tr>
<tr><td>උපදේශන ආදායම - රු.මිලියන</td><td>1,509</td><td>2,116</td></tr>
<tr><td>ඉංජිනේරුවන් සංඛ්‍යාව</td><td>341</td><td>395</td></tr>
<tr><td>එක් ඉංජිනේරුවෙකුගේ ආදායම - රු.මිලියන</td><td>4.42</td><td>5.35</td></tr>
<tr><td>සේවකයෙකු සඳහා ආදායම - රු.මිලියන</td><td>1.12</td><td>1.93</td></tr>
</table></td><td>වර්ෂයකට ආසන්න වශයෙන් රු.බිලියන 2 ක උපදේශන ආදායම පමණක් ඉපැයීම සඳහා ඉංජිනේරුවන් 395 ක් ඇතුළුව සේවකයින් 1,094 ක් යෙදවීමේ අවශ්‍යතාවය නැවත සලකා බැලීමට කාර්යාංශයේ අවධානය යොමු විය යුතුය.</td></tr>
</table>

| | | | |
|---|---|---|---|
| | 23.58 සහ රු.මිලියන 8.97 (ඉදිකිරීම් සහ උපදේශන ආදායම යන දෙකම) උපයා තිබුණි. කෙසේ වෙතත්, 2012 වර්ෂයේදී පරිපාලිතය පිහිටුවීමෙන් පසු මෙම ආදායම 2021 වර්ෂය වන විට රු.මිලියන 6.29 සහ රු.මිලියන 2.27 දක්වා අඩු වී තිබුණි. | | |
| (ආ) | කාර්යාංශයට 2021 දෙසැම්බර් 31 දිනට එහි පරිපාලිතයෙන් ලැබිය යුතු රු.මිලියන 1,431.24 ක ශේෂයක් පෙන්වා දී ඇති අතර, මෙම මුදලට වරින් වර පරිපාලිතය වෙත නිකුත් කරන ලද වාහන කුලියට ගැනීමේ ගාස්තු, තාවකාලික ණය, ස්ථාවර වත්කම්වල වටිනාකම සහ තොග ආදිය ඇතුළත් විය. මෙම ශේෂය අයකර ගැනීමට ඵලදායි ක්‍රියාමාර්ග නොගෙන වර්ෂයෙන් වර්ෂය අඛණ්ඩව මෙම ශේෂය ඉහළ ගිය බව වැඩිදුරටත් සටහන් විය. ඊට අමතරව පරිපාලිතයේ ව්‍යාපාරික මෙහෙයුම් ආරම්භ කිරීම සඳහා 2011 වර්ෂය තුළදී රු.මිලියන 10 ක ප්‍රාග්ධන දායකත්වයක් පරිපාලිතය වෙත ලබා දී තිබුණි. එසේ වුවද, අනුබද්ධ ආයතනය ආරම්භයේ සිටම මෙම ආයෝජන සඳහා කිසිදු ප්‍රතිලාභයක් ලබාගෙන නොතිබුණි. | අධ්‍යක්ෂ මණ්ඩලයේ උපදෙස් මත, අන්තර් සමාගම් ශේෂය සඳහා කොපමණ කලක් සලකා බැලිය යුතුද යන්න පිළිබඳ මතයක් ලබා දීම සඳහා උපදේශන සමාගමකට පැවරීම භාර දී ඇත. උපදේශක විසින් ලබා දී ඇති කෙටුම්පත් වාර්තාව සමාලෝචනය කරමින් සිටින අතර ඒ අනුව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ඇතිව අවශ්‍ය ගැලපීම් සිදු කිරීමට අපි අදහස් කරමු. | කළමනාකරණය විසින් බේරුම්කරණ ක්‍රියා පටිපාටියක් හඳුන්වා දිය යුතුය. |

### 3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

-----------------------------------------------------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කාර්යාංශයට කොළඹ 07, සරණ පාරේ පිහිටි නිවාස ඒකක 15 කින් සමන්විත නිල නිවාස සංකීර්ණයක් | | |

| | | |
|---|---|---|
| ඇති අතර එම නිවාස සංකීර්ණය පිහිටි ඉඩමේ වටිනාකම රු.මිලියන 960 ක් වන අතර ගොඩනැගිලි වටිනාකම රු.මිලියන 60.4 ක් ලෙස ගිණුම්වල සඳහන් කර තිබුණි. මේ සම්බන්ධයෙන් පවත්වන ලද විගණන පරීක්ෂණයේදී පහත නිරීක්ෂණ අනාවරණය විය. | | |
| • ඉහත නිල නිවාස 15න් නිල නිවාස 03ක් 2004 සහ 2015 යන වර්ෂවලදී පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් තිදෙනෙකුට වෙන් කර තිබූ අතර තවත් නිල නිවාස 02ක් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂවරයාගේ සහ එවකට රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ප්‍රයෝජනය සඳහා එම පාර්ශ්වයන් සමඟ කිසිදු කුලී හෝ බදු ගිවිසුමකට එළඹීමකින් තොරව ලබා දී තිබුණි. මේ අතර, ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂවරයාට වෙන් කරන ලද නිල නිවාසය සඳහා 2011 ජනවාරි මාසයේ සිට මේ දක්වා කිසිදු කුලී මුදලක් අය කර ගෙන නොතිබුණි. | කාර්යාංශයේ නිල නිවාස අංක ඩී7 හි පාර්ලිමේන්තු මන්ත්‍රී මංජුල දිසානායක මහත්මිය ද, නිල නිවාස අංක (සී) හි පාර්ලිමේන්තු මන්ත්‍රී ප්‍රේමලාල් ජයසේකර මහතා ද වාසය කරනු ඇත. 2022 ජූලි දක්වා කුලී නිරවුල් කර ඇති අතර, දෙදෙනාම ඔවුන් වෙත එවන ලද කුලී ගිවිසුම් අත්සන් කර ආපසු ලබා දී නැත.<br><br>නිල නිවාසය ජනාධිපතිගේ හිටපු ප්‍රධානියා, හිටපු අගමැති ලේකම් සහ හිටපු වාරිමාර්ග අමාත්‍යාංශයේ ලේකම් අනුර දිසානායක මහතා විසින් දරනු ලබයි. සියලුම කුලී නිරවුල් කර ඇත.<br><br>ඒ-1 නිල නිවාස ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත නිකුත් කර ඇති අතර 2010 ජනවාරි දක්වා සියලුම කුලී ගෙවා ඇත. 2011 වසරෙන් පසු කුලී කිසිවක් ලැබී නොමැති අතර නිල නිවාසයේ නඩත්තු කටයුතු මහවැලි අධිකාරිය විසින් සිදු කරනු ලබයි. | රජයේ ප්‍රධාන තක්සේරුකරුගෙන් ලබා ගන්නා තක්සේරු වාර්තාව මත පදනම්ව සුදුසු කුලී නිශ්චය කිරීමෙන් පසු එම පාර්ශ්ව සමඟ බදු ගිවිසුම්වලට එළඹීමට කටයුතු කළ යුතුය. |
| • ඉහත නිල නිවාස සඳහා කුලිය නියම කිරීමට පෙර ප්‍රධාන තක්සේරුකරුගේ වාර්තාව ලබාගෙන නොතිබුණි. | කුලී නියම කිරීම සඳහා ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 5.6 වගන්තිය යටතේ සපයා ඇති ප්‍රධාන තක්සේරුකරුගේ වාර්තාව ලබා ගැනීමට පියවර ගනිමින් පවතී. | ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කිරීමට කටයුතු කළ යුතුය. |
| • පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට වෙන් කර ඇති නිල නිවාසයක් සඳහා පිළිවෙළින් රු.12,056,803ක් සහ රු.1,778,722ක් ලෙස විදුලිය හා ජල ගාස්තු 2022 මැයි 31 දිනට හිඟව පවතින බව අනාවරණය විය. | නියමිත වේලාවට බිල්පත් ගෙවීම කුලී නිවැසියන්ගේ වගකීමකි. තවද ගෙවිය යුතු මුදල් අයකර ගැනීම සේවා සපයන්නන්ගේ කාර්යයකි. | හිඟ මුදල් පිළිබඳ අවසන් වගකීම භාර ගැනීමට කාර්යාංශය සිදුවනු ඇත. එබැවින් එවැනි පාඩු අවම කර ගැනීමට |

| | | |
|---|---|---|
| ඉදිරියේදී හිඟ බිල්පත් ගෙවීමට අදාළ පදිංචිකරු අපොහොසත් වුවහොත් හිඟ මුදල් සඳහා වන අවසන් වගකීම භාර ගැනීමට කාර්යාංශය සිදුවන බව වැඩිදුරටත් නිරීක්ෂණය විය. | | කටයුතු කළ යුතුය. |
| • මෙම නිල නිවාස සංකීර්ණය ඉහළ ආර්ථික වටිනාකමක් ඇති මධ්‍යස්ථානයක පිහිටා තිබුණද 2020 සහ 2021 වර්ෂවල කාර්යාංශය උපයා ඇති මුළු කුලී ආදායම පිළිවෙලින් රු.1,803,878 සහ රු.1,966,976 ක් පමණි. මෙම මුළු කුලී ආදායම මුළු වත්කම් වටිනාකම සමඟ සසඳන විට, එය නියෝජනය කරන්නේ මුළු වත්කම් වටිනාකමෙන් සියයට 0.2ක් පමණි. එබැවින් වැඩි ආර්ථික වටිනාකමක් ඇති මෙම දේපළෙන් උපරිම ප්‍රයෝජන ගැනීමට කාර්යාංශයේ අවධානය යොමු වී නොතිබුණි. | නිල නිවාස සංකීර්ණය ප්‍රදේශයේ ඉහළ ආර්ථික වටිනාකම සැලකිල්ලට ගනිමින් කාර්යාංශය විසින් එම ස්ථානයේ බහු මහල් ගොඩනැගිලි සංකීර්ණයක් පිහිටුවීම සඳහා දැනටමත් සැලසුම් සකස් කර මූලික කටයුතු අවසන් කර ඇත. කෙසේ වෙතත්, රට තුළ පවතින ආර්ථික අර්බුදය සහ අවශ්‍ය ඉදිකිරීම් අනුමැතිය ලබා ගැනීමේ දුෂ්කරතා හේතුවෙන් සැලසුම් අත්හිටුවා ඇති අතර තත්වය යහපත් වූ පසු සැලසුම් කළ ඉදිකිරීම් සිදු කිරීමට නියමිතය. | මෙම දේපළෙන් උපරිම ප්‍රයෝජන ගැනීමට කාර්යාංශයේ අවධානය යොමු විය යුතුය. |

## 3.5 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | | | නිර්දේශය |
|---|---|---|---|---|
| | ව්‍යාපෘතියේ නම | පිරිනැමූ වටිනාකම රු. | අත්හැරීමට හේතුව | |
| 2021 වර්ෂයේදී රු.2,671,554,919ක් වටිනා ඉදිකිරීම් ව්‍යාපෘති දොළහක් (12) පරිපාලිතයට පවරා ඇති අතර ඉන් රු.519,926,517ක් වටිනා ව්‍යාපෘති 3ක් විවිධ හේතුන් මත නිම නොකර අත්හැර දමා තිබුණි. | 1. නාගරික සංවර්ධන අධිකාරිය විසින් අත්පත් කරගත් ඉඩම් සංවර්ධනය කිරීම | 111,817,502 | ව්‍යාපෘතිය 2021 දී ආරම්භ කරන ලදී. මෙය යූ.ඩී.ඒ. යටතේ ඇති ව්‍යාපෘතියක් වන අතර සේවාදායකයාගේ මූල්‍ය බාධාවන් හේතුවෙන් ව්‍යාපෘතිය අත්හිටුවන ලදී. | නියමිත කාල සීමාව තුළ ඉදිකිරීම් ව්‍යාපෘති කටයුතු නිම කිරීමට උපරිම උත්සාහය ගත යුතුය. |
| | 2. ගම්පොල දුම්රිය මාර්ගයට සමාන්තරව බයිපාස් | 291,374,215 | ව්‍යාපෘතිය 2021 දී ආරම්භ කරන ලදී. මෙය යූ.ඩී.ඒ. යටතේ ඇති ව්‍යාපෘතියක් වන | |

| | | |
|---|---|---|
| මාර්ගය ඉදිකිරීම | | අතර සේවාදායකයාගේ මූල්‍ය බාධාවන් හේතුවෙන් ව්‍යාපෘතිය අත්හිටුවන ලදී. |
| 3.″මිහිකත මැදුර″ ගොඩනැගිල්ලේ සිව්වන මහල ඉදිකිරීම. | 116,734,800 | ව්‍යාපෘතිය 2021 දී ප්‍රදානය කරන ලද අතර 2022 දී ආරම්භ කරන ලදී. පසුව ප්‍රධාන වශයෙන් මූල්‍ය බාධාවන් හේතුවෙන් සේවාදායකයා ව්‍යාපෘතියේ විෂය පථය අඩු කර ඇත. |

## 3.6 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 වර්ෂය සඳහා සකස් කරන ලද ප්‍රසම්පාදන සැලැස්මට අනුව, මිලදී ගැනීමට බලාපොරොත්තු වන භාණ්ඩවල ඇස්තමේන්තුගත වටිනාකම රු.424,519,369 කි. කෙසේ වෙතත්, 2021 වර්ෂය තුළ මිල දී ගත් සත්‍ය භාණ්ඩවල වටිනාකම රු.293,264,520ක් පමණක් වූ අතර එය නියෝජනය කරන්නේ මුළු ඇස්තමේන්තුගත වටිනාකමෙන් සියයට 69.08ක් පමණි. මේ අනුව, ප්‍රසම්පාදන සැලැස්ම තාර්කික පදනමක් මත සකස් කර ක්‍රියාත්මක කර නොමැති බව නිරීක්ෂණය විය. | ඉදිරියේදී වඩාත් යථාර්ථවාදී ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කිරීමට අපි බලාපොරොත්තු වෙමු. | ක්‍රියාකාරකම් නියමිත වේලාවට අවසන් කිරීම සහතික කිරීම සහ ඒ සඳහා හොඳම වෙළඳපල වටිනාකම ලබා ගැනීම සඳහා සමස්ත ප්‍රසම්පාදන ක්‍රියාවලිය කාර්යක්ෂමව සැලසුම් කිරීම අත්‍යවශ්‍ය වේ. |

## 3.7 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) යහපාලනය සඳහා වූ පොදු ව්‍යවසාය මාර්ගෝපදේශ පිළිබඳ 2003 ජූනි 02 දිනැති අංක | කලින් කලට පැන නගින අනාගත ව්‍යාපෘති වැඩ අවශ්‍යතා සඳහා සේවා | කාර්යාංශයේ අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවන විවිධ කාණ්ඩ යටතේ බඳවා |

| | | | |
|---|---|---|---|
| | පිරිඞී/12 පොදු ව්‍යවසාය චක්‍රලේඛයේ 9.2 (ඉ) සහ (ඊ) ඡේදයන්ට අනුව, නව සේවක සංඛ්‍යාවක් නිර්මාණය කිරීමේදී සහ සේවක සංඛ්‍යාව අතිරික්තයක් ඇති අවස්ථා වලදී, කාර්යාංශය විසින් රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ අනුමැතිය හෝ උපදෙස් ලබා ගත යුතුය. කෙසේ වෙතත්, ඊට පටහැනිව, අනුමත සේවක සංඛ්‍යාවට නව තනතුරු 03ක් ඇති කරමින් සමාලෝචිත වර්ෂය තුළ නිලධාරීන් 24 දෙනෙකු වැඩියෙන් බඳවාගෙන තිබුණි. තවද අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා නිලධාරීන් 151ක් තනතුරු 10ක් සඳහා බඳවාගෙන තිබුණි. | සැපයීම සඳහා කොන්ත්‍රාත් පදනම මත කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට කාර්යාංශයට බල කෙරේ. | ගන්නා සේවකයින් පිළිබඳ තොරතුරු එහි සලකා බැලීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | කාර්යාංශය විසින් පරිපාලිතයට මුදා හරින ලද සේවක සංඛ්‍යාව සහ පරිපාලිතය විසින් ඉදිරිපත් කරන ලද උපලේඛනවල දක්වා ඇති සේවක සංඛ්‍යාව අතර සේවක සංඛ්‍යාව 10 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර, මෙම වෙනසට හේතු විගණනයට පැහැදිලි කර නොතිබුණි. | 2021.12.31 දිනට කාර්යාංශයේ සේවක සංඛ්‍යාව යාවත්කාලීන කිරීම නිවැරදිය. | වෙනස සැසඳුම් කිරීමට පියවර ගත යුතුය. |

## 3.8 වාහන පද්ධතිය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සීමාසහිත සමූපකාර රක්ෂණ සමාගමෙන් 2021 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය තුළ ලබාගත් රක්ෂණ හිමිකම් සම්බන්ධයෙන් පවතින තොරතුරුවලට අනුව වාහන අනතුරු 16ක් සම්බන්ධයෙන් අවස්ථා 17කදී රු.1,113,793ක මුදලක් රක්ෂණ හිමිකම් වශයෙන් ලැබී තිබුණි. එසේ වුවද, මුදල් රෙගුලාසි 104(2) ප්‍රකාරව වාහන අනතුරු කිසිවක් විගණකාධිපතිවරයා වෙත වාර්තා කර නොතිබූ අතර අනතුර සම්බන්ධ පොලිස් වාර්තාවේ පිටපතක් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. තවද වගකීම නිවැරදි කිරීම | 2021 වර්ෂයට අදාළ වාහන අනතුරු, රක්ෂණ හිමිකම් ආදී විස්තර විගණනය සඳහා දැනටමත් ලබා දී ඇත. | සම්පූර්ණ වාර්තාවක් සැකසීමට දින 7කට වඩා ප්‍රමාදයක් අපේක්ෂා කරන්නේ නම්, මූලික වාර්තාව වහාම එවිය යුතු අතර, පරීක්ෂණයෙන් පසු, සම්පූර්ණ වාර්තාව අලාභ වූ දින සිට මාස 3ක් ඇතුළත ඉදිරිපත් කළ යුතුය. |

සඳහා කිසිදු පරීක්ෂණයක් ආරම්භ කර නොතිබුණි.

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 වාර්ෂික වාර්තාව**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| යහපාලනය සඳහා වන රාජ්‍ය ව්‍යවසාය මාර්ගෝපදේශ පිළිබඳ 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ අංක පීඊඩී/12 හි 6.5.3 ඡේදය සහ රජය සතු ව්‍යවසායන් සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශ අනුව 2019 සහ 2020 වර්ෂ සඳහා කාර්යාංශයේ වාර්ෂික වාර්තාව මෙම වාර්තාව නිකුත් කරන දිනය දක්වාවත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර නොතිබුණි. | 2019 වර්ෂයේ වාර්ෂික වාර්තාව 2022 අගෝස්තු මස අවසානයේදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කෙරේ. 2020 වාර්ෂික වාර්තාව කෙරීගෙන යමින් පවතී. | වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කළ යුතුයි. |

**4.2 උපායමාර්ගික සැලැස්ම සකස් කිරීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| නියමිත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා, පැහැදිලිව නිර්වචනය කරන ලද ප්‍රධාන කාර්ය සාධන දර්ශක (KPIs) ක්‍රියාත්මක බව සහතික කිරීම සහ එම සැලැස්ම ක්‍රියාත්මක කිරීම අඛණ්ඩව සමාලෝචනය කිරීම සහ අවශ්‍ය සෑම තැනකදීම නිවැරදි ක්‍රියාමාර්ග ගැනීම සඳහා රජය සතු ව්‍යවසායන් සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශවල 2.3 ඡේදයට අනුව, 2021 - 2025 සහ 2022 - 2026 කාලය සඳහා උපාය මාර්ගික සැලැස්මක් සකස් කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2022 – 2026 උපායමාර්ගික සැලැස්ම අවසන් කර ඇති අතර මණ්ඩල අනුමැතිය සඳහා බලා සිටී. | රාජ්‍ය සතු ව්‍යවසායන් සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශයන්ට අනුව උපාය මාර්ගික සැලැස්මක් සකස් කර විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

**4.3 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද ක්‍රියාකාරී සැලැස්මට සහ ප්‍රගති වාර්තාවට අනුව කාර්යාංශයේ අංශ 05ක් සඳහා පවරා ඇති රු.29,750,000ක ඇස්තමේන්තු වටිනාකමට ඉලක්කගත ක්‍රියාකාරකම් 26ක් සම්බන්ධයෙන් ප්‍රගතියක් වාර්තා වී නොතිබුණි. මෙම තත්ත්වය කාර්යාංශයේ සමස්ත කාර්ය සාධනයට දැඩි ලෙස බලපා ඇත. | මූල්‍යමය සීමාවන්, කොවිඩ් 19 වසංගතය හේතුවෙන් ඇති වූ සීමා කිරීම් ආදිය හේතුවෙන් අපට අපේක්ෂිත පරිදි ක්‍රියාකාරී සැලැස්මේ සමහර ක්ෂේත්‍ර ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. | නියමිත ඉලක්ක ඵලදායී ලෙස සාක්ෂාත් කර ගැනීම සඳහා ක්‍රියාකාරී සැලැස්ම යථාර්ථවාදී පදනමක් මත සකස් කළ යුතුය. |